**කෘෂිකර්ම, ධීවර හා පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය**

# ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

# අභිලාෂයන් ප්‍රකාශ කිරීම සඳහා ඉල්ලීම් කිරීම

**(Expressions of Interest)**

පැවරුම : මහවැලි එල් කලාපයේ සහ රඹකැන්ඔය කලාපයේ කුඩා වැව් ප්‍රතිසංස්කරණය හා කෘෂිකාර්මික ව්‍යාපෘති සංවර්ධනය සඳහා මූලික පාරිසරික පරීක්ෂණ වාර්තා (IEER) සහ පාරිසරික බලපෑම තක්සේරු (EIA) වාර්තා සකස් කිරීම සඳහා උපදේශන සේවාවක් සපයා ගැනීම.

යොමු අංකය : MASL/PROC/CS/2025/QCBS/03

1. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියයේ දෙපාර්තමේන්තු උපදේශන ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙනුවෙන් එහි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉහත දක්වා ඇති උපදේශන සේවාව සැපයීම සඳහා උනන්දුවක් දක්වන සුදුසුකම් ලත් උපදේශන සමාගම් වෙත තම අභිලාෂයෙන් ඉදිරිපත් කරන ලෙස මෙයින් ආරාධනා කරනු ලැබේ.

2. යෝජිත මහවැලි එල් කලාපයේ සහ රඹකැන්ඔය කලාපයේ කුඩා වැව් ප්‍රතිසංස්කරණය හා කෘෂිකාර්මික ව්‍යාපෘති සංවර්ධනය සඳහා මූලික පාරිසරික පරීක්ෂණ (Initial Environmental Examination -IEE) වාර්තා සහ පාරිසරික බලපෑම තක්සේරු (Environmental Impact Assessment- EIA) වාර්තා සකස් කිරීම සඳහා උපදේශන සේවාවක් සපයා ගැනීම සඳහා සුදුසුකම් සහ අත්දැකීම්ලත් උපදේශන ආයතන වෙත තම අභිලාෂයන් ඉදිරිපත් කළ හැකිය.

3. මෙම IEE/EIA අධ්‍යයන වල අරමුණ වන්නේ 1980 වර්ෂයේ සම්මත කරන ලද අංක 47 දරන ජාතික පාරිසරික පනතේ (සංශෝධිත) විධිවිධාන සහ මධ්‍යම පරිසර අධිකාරිය (CEA) විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුකූලව යෝජිත ව්‍යාපෘතියෙන් ඇතිවිය හැකි පාරිසරික හා සමාජ බලපෑම තක්සේරු කිරීමය. මධ්‍යම පරිසර අධිකාරිය සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව (FCD) විසින් නිකුත් කරන ලද කාර්යය නිර්නය පත්‍රිකා (Terms of Reference -TOR) වලට අනුකූලව මෙම අධ්‍යයනය සිදු කළ යුතුය. ජාත්‍යන්තරව පිළිගත් මූලික පාරිසරික සහ පාරිසරික බලපෑම් තක්සේරුකරණ රෙගුලාසි ද සැලකිල්ලට ගෙන මෙම වාර්තා සකස් කල යුතුය.

4. අදාල උපදේශන සමාගම් විසින් මූලික දත්ත රැස්කිරීම, බලපෑම ඇඟයීම තක්සේරුකරණය, පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කිරීම ආදිය තුළින් දත්ත එක්රැස්කර ඒවා උපයෝගී කර පාරිසරික කළමනාකරන සැලැස්මක් සහ මූලික පාරිසරික පරීක්ෂණ වාර්තා යන පාරිසරක බලපෑම තක්සේරු කිරීම් වාර්තා සකස් කිරීමේ වගකීම අදාළ උපදේශන සමාගම විසින් ඉටුකල යුතුය. එම අවසන් වාර්තා (IEE and EIA) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු මධ්‍යම පරිසර අධිකාරිය සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යවා සමාලෝචනය කිරීමෙන් අනතුරුව අනුමැතිය ලබාගත යුතුය.

5. මේ හා සමාන ව්‍යාපෘතිවල පාරිසරික ඇගයීම් හා පාරිසරික තක්සේරු වාර්තා සකස්කිරීමේ පළපුරුද්ද සහිත සුදුසුකම්ලත් උපදේශන ආයතන පහත සඳහන් තොරතුරු සමග තම අභිලාෂයන් ඉදිරිපත් කළ යුතුය.

   (i). ආයතනයේ තොරතුරු
   (ii). පසුගිය වසර 05 තුළ සිදුකර ඇති මේ හා සමාන සුදුසුකම් සහිත පැවරුම්
   (iii). ආයතනයේ ප්‍රධාන නිලධාරීන්ගේ ජීව දත්ත තොරතුරු
   (iv). පසුගිය වසර 03ක මූල්‍ය ගිණුම් ප්‍රකාශන

6. ජාතික ප්‍රසම්පාදන ආයතනයේ 2007 වර්ෂයේ නිකුත් කරන ලද උපදේශන සේවා මාර්ගෝපදේශ අත්පොතෙහි නියමයන්ට අනුකූලව ගුණාත්මක හා පිරිවැය පදනම්කර තෝරාගැනීමේ ක්‍රමය (QCBS) යටතේ අදාල සුදුසුකම් සපුරා ඇති උපදේශන සේවා සමාගම් තොරාගනු ලබයි.

7. මේ පිළිබඳව කැමැත්තක් දක්වන ආයතන අදාල විස්තර හා තොරතුරුවල මුල් පිටපතක් සහ අනුපිටපත් 05 ක් සමග තම අභිලාෂයන් ඉදිරිපත් කළ යුතුය

8. වැඩිදුර තොරතුරු සඳහා ඊමේලි ලිපිනය : masldpcsec@gmail.com

9. සම්පූර්ණ කරන ලද අභිලාෂයන් ලියාපදිංචි තැපැල මගින් හෝ ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට **2025.10.30 වන දින ප.ව. 2.00** ට පෙර අතින් ගෙනවිත් භාරදිය හැකිය.

**අධ්‍යක්ෂ ජනරාල්**
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
9 වන මහල
ප්‍රසම්පාදන අංශය
අංක 500, ටී.බී. ජයා මාවත
කොළඹ 10

දුරකතන අංකය 0112687235
ඊමේලි ලිපිනය : masldpcsec@gmail.com